# හත්ථිකුච්ඡි විහාරයේ ගල් ලෙන් හා එහි වාස්තුවිද්‍යාව

එච්.එම්.ජේ.එල්.ජේ. හේරත්

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
hmjljherath@gmail.com

ප්‍රමුඛ පදඃ හත්ථිකුච්ඡි විහාරය, ලෙන්, වාස්තුවිද්‍යාව, මැටිගඩොල්

## හැඳින්වීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුවට නුදුරුව රාජාංගනයේ හත්ථිකුච්ඡි විහාරය නම් වූ ඓතිහාසික ස්ථානය පිහිටා ඇත. කුරුණෑගල සිට ඇල්ල හරහා අනුරාධපුරය දක්වා දිවෙන මහා මාර්ගයේ 43 සැතපුම් කණුව අසල මහගල්කඩවල හන්දියෙන් වමට හැරී සැතපුම් 3ක් පමණ ගිය විට මෙම ඓතිහාසික විහාර භූමියට ප්‍රවේශ විය හැකි ය. මෙය ප්‍රධාන වශයෙන් සිරිසඟබෝ රජු හිස දන් දුන් ස්ථානය යැයි ද ප්‍රසිද්ධියක් උසුලයි. තව ද ස්වභාව සෞන්දර්යෙන් යුක්ත වූ මෙම භූමිය සංචාරක ආකර්ශනයට ද නිතැතින් ම ලක් වේ. හත්ථිකුච්ඡි භූමියේ අක්කර 300 ක් පමණ වපසරියක ඓතිහාසික වශයෙන් වටිනාකමක් ඇති නටබුන් විසිර පවතී. එහි ආගමික වශයෙන් වැදගත්කමක් ඇති පොහොය ගෙය, ප්‍රතිමා ගෘහය, වටදාගෙය, ජන්තාඝරය, බෝධිඝරය යන වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ දක්නට හැකි ය. නටබුන් දකින්නට පුළුවන. ඒ අතර ඇති පැරණි ගල් ලෙන් ද හත්ථිකුච්ඡි විහාරයේ වටිනාකම වැඩි කිරීමට සමත් වේ. එහි ගල් ලෙන් 38ක් දැකගත හැකි වේ. මෙහි දී ශ්‍රී ලංකාවේ ගල් ලෙන් වාස්තුවිද්‍යාවේ, දක්නට ඇති වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හත්ථිකුච්ඡි විහාරයේ ගල් ලෙන්වලින් කොතෙක් දුරට පිළිබිඹු වේද යන්න මෙම අධ්‍යයනයේ දී විමසීමට ලක්වන අතර ඒ මඟින් ගල් ලෙන්වල වාස්තුවිද්‍යාත්මක අගය විමසා බැලීමත්, ඒවායේ කලාත්මක අගය හඳුනාගැනීමත්, එහි තාක්ෂණික ක්‍රම හඳුනාගැනීමත් අරමුණු කර ගන්නා ලදි. හත්ථිකුච්ඡි භූමිය පිළිබඳ බොහෝ පර්යේෂණ සිදු කර තිබුණ ද මෙහි ගල් ලෙන් සඳහා ම වූ සුවිශේෂී වාර්තාවක් සකස් වී නොමැත. එම අරමුණු ද පෙරදැරි කරගෙන මෙම අධ්‍යයනය සිදු කිරීමට බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු එක්රැස් කිරීමේ දි මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනයන් කෙරහි වැඩි අවධානයක් යොමු කරන ලදි. මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනයන් ප්‍රධාන වූ අතර අදාළ භූමියට ගොස් දත්ත එකතු කිරීමත්, ඡායාරූපගත කිරීමත්, සැලසුම් ඇඳීමත් සිදු කරන ලදි. එමෙන් ම අදාළ ප්‍රදේශය සම්බන්ධ ලියවී ඇති මූලාශ්‍ර කෙරේ වැඩි අවධානයක් යොමු කිරීම ද විශේෂ වේ. හත්ථිකුච්ඡි විහාරයේ ගල් ලෙන් 38 ක් මුළු භූමිය පුරා විසිරී පවතින බව ඉහතින් සඳහන් කරන ලදි. මෙම ලෙන් මයිලෑව, තඹුත්ත ප්‍රදේශයන් ද දක්වා ව්‍යාප්තව පවතී. ඒ අනුව අධ්‍යයන සීමාව සඳහා ගල් ලෙන් 20ක් තෝරා ගැනීම සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

හත්ථිකුච්ඡි විහාරය ක්‍රිස්තු පූර්ව තුන් වැනි සියවසේ පටන් ම ගල් ලෙන් ආශ්‍රය කරගෙන බෞද්ධ භික්ෂූන් වැඩවාසය කර

ඇති පුද බිමක් ලෙස සැලකේ (විජේතුංග,2002;01). මූලාශ්‍රය ගත තොරතුරු අනුව සද්ධාතිස්ස රජතුමාගේ සොහොයුරියකගේ පුත්‍ර වූ පුස්ස දේව නම් අමාත්‍ය හත්ථිකුච්ඡි විහාරයේ පැවිදි වූ බවත් , එසේ පැවිදි වීමට හේතු වූ කරුණක් වූයේ නම් විහාරයේ භික්ෂූන් වාසය කළ ගල් ලෙන් තබා තිබූ සන්සුන් පිළිවෙල බවත් සඳහන්ව ඇත (පියරතන හිමි,1949;115). එයින් පසක් වනුයේ නිසංසල සුවදායී පරිසරයක මෙම ගල් ලෙන් භාවනායෝගී භික්ෂූන්ට වාසභූමි වූ බව ය. අනුරාධපුර යුගයේ පටන් මහනුවර යුගය තෙක් දිවෙන ලක්ෂණ මෙම ගල් ලෙන් තුළින් පිළිඹිබු කිරීම ද විශේෂත්වයකි.

මෙම භූමියේ, ගල් ලෙන් වෘත්තාකාර සැලැස්මකට මෙන් පිහිටා ඇති අතර ඒවා පොකුරු වශයෙන් ද දකින්නට හැකි ය. මෙම වෘත්තාකාර සැළැස්ම තුළ පසුකාලීනව ඉදි වූ පොහොය ගෙය, ප්‍රතිමා ගෘහය, වටදාගෙය, ජන්තාඝරය, බෝධිඝරය ආදිය ස්ථානගත වී ඇත. ගල් ලෙන්වල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ විමසීමේ දි ගල් ලෙන් සඳහා මුලින් ම එකතු වූ වාස්තුවිද්‍යාත්මක අංගය වූයේ ලෙනෙහි පියස්ස කෙළෙවරින් කපා සකස් කළ කටාරයයි. ගල දිගේ ඇදී එන ජලය ලෙන තුළට ගලා යෑම වළක්වා ලෙන් පියස්සෙන් කෙළින්ම බිමට වැටෙන්නට සැලැස්වීම ඉන් අපේක්ෂා කරන ලදි. හත්ථිකුච්ඡි විහාරයේ ද මෙලෙස කටාර කොටන ලද ගල් ලෙන් දැකිය හැක. මෙහි කටාරයට පහළින් කටු භාවිතයෙන් එකිනෙකට ළඟින් තිරස් අතට කපන ලද රේඛා තුළින් ද ලෙන තුළට ජලය ගලා ඒම තව දුරටත් හොඳින් පාලනය කිරීම සිදු වේ. ලෙන් කටාරයට පහළින් බ්‍රාහ්මී සෙල්ලිපි දකින්නට ලැබීම ද විශේෂිත වේ. එම ලෙන් ලිපි මගින් භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම පිළිබඳ දක්වන අතර එහි වෛද්‍යවරයෙකුගේ පුත්‍රයෙක් විසින් පූජා කළ ලෙනක් ගැන ද සඳහන් වේ. ලෙන් නිර්මාණයේ දි ස්වභාවික පරිසරය ද ඊට ප්‍රමුඛ වේ. හත්ථිකුච්ඡි විහාර ගල් ලෙන් වල විශේෂත්වයක් වන්නේ ද ඒවා මෙම භූමියේ උස් ස්ථානයන්හි පිහිටා තිබීමත් ඒ අවට ඇති සාමකාමී පරිසරයත් ය. මෙම සාමකාමී පරිසරය අතීත භික්ෂූන්ගේ භාවනායෝගී දිවිපැවැත්මට මනා පිටුවහලක් වන්නට ඇත.

ගල් ලෙන්වල කටාර කෙටීමෙන් නොනැවති පසුකාලීනව තවත් වාස්තු විද්‍යාත්මක අංග ලෙස බිත්ති නිර්මාණය කිරීම ද සිදුවිය. මෙහි ඇති ලෙන් විහාරයේ හැර ලෙන් පහක නටබුන් වී ගිය බිත්ති කොටස් දැකිය හැකි ය. ලෙන් විහාරය තවමත් හොඳින් ආරක්ෂා වී පවති. බිත්ති බැඳීම සඳහා බහුල වශයෙන් පිළිස්සූ මැටි ගඩොල් භාවිත කර ඇත. ගඩොල් වලට සාපේක්ෂව පාෂාණ ද ඒ සඳහා යොදා ඇති අතර ග්‍රැනයිට් පාෂාණය ඊට භාවිතා කර ඇත. වඩාත් සනකමින් හා ශක්තිමත් බිත්ති බැඳීමට ගල් කුට්ටි ද යොදා ගෙන තිබේ. වහල නිර්මාණය පිළිබඳ අධ්‍යයනයේ දි ආසන්නයේ පිහිටා ඇති ලෙන් දෙකක් අතර කුඩා පියස්සක් නිර්මාණය කර තිබූ බවට ද මෙම ලෙන් අතරින් සාධක හමු වේ. එසේ නිගමනය කිරීමට හේතුව නම් ඒවායේ කුඩා කැපුම් කට්ටවල් දැකගත හැකිවීමය. එවැනි ලෙන් තුනක් හඳුනාගත හැකි විය.

හත්ථිකුච්ඡි විහාර ගල් ලෙන්වල සුවිශේෂී අවස්ථාවක් වන්නේ ලෙන් විහාරයක් නිර්මාණය වීමය. එය මෙහි සංවර්ධනීය අවස්ථාවක් ලෙස දකින්නට හැකි ය. මෙහි ලෙන් විහාරය මහනුවර යුගයේ ඉදි වූවකි. කටාරම් කොටා සැකසූ ඉපැරණි ගල් ලෙනක් තුළ මහනුවර යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කරවා මෙම ලෙන් විහාරය තනා ඇත. ගල් ලෙන්, ප්‍රතිමා ගෘහ වශයෙන් ඉදි වීමේ දි ලෙනෙහි විශාලත්වය පිළිබඳ වැඩි වශයෙන් අවධානය යොමු කර ඇත. රියන් 18ක් පමණ දිගින් යුත් සැතපෙන

පිළිමයක් මෙම ලෙන් විහාරය තුළ දැකගත හැකි ය. කටාරයට පහළින් ලෙන සම්පූර්ණයෙන් ම ආවරණය වන සේ බිත්තිය බැඳ ඇති අතර මෙහි ජනෙල් කවුළු දෙකක් හා ආරුක්කු හැඩයෙන් යුතු පිවිසුමක් ද වේ.

ගල් ලෙන් සඳහා ප්‍රවේශ මාර්ග නිර්මාණය ද වාස්තුවිද්‍යාත්මක වශයෙන් වැදගත් වේ. එහිදි ගලේම නිර්මාණය කරන ලද ගල් පඩි පෙළවල් හා කපා ඔප මට්ටම් කරන ලද ගල් පුවරු භාවිත කර සකසන ලද පඩි පෙළවල් ද වේ. ලක්දිව බොහෝ ලෙන් සංකීර්ණ ආශ්‍රිත පොකුණු නිර්මාණය වීම ද දැකිය හැකි අතර එම ලක්ෂණය හත්ථිකුච්ඡි ලෙන් සංකීර්ණය ආශ්‍රිත ව ද දකින්නට පුළුවන. එහි පොකුණු දහසයක් වේ. එහි "හිරු සඳු නොදකින පොකුණ" යනුවෙන් ව්‍යවහාර වන පොකුණ ඉන් සුවිශේෂි වේ.

මේ ආකාරයට හත්ථිකුච්ඡි ගල් ලෙන් ආශ්‍රිත ව ඉහත වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ දැකගත හැකි ය. මේ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ ආදි මානවයින් වාසස්ථාන ලෙස භාවිත කළ ගල් ලෙන් පසු ව බෞද්ධ භික්ෂූන් වහන්සේගේ භාවනායෝගී ස්ථාන බවට පත් විය. මෙලෙසට භික්ෂූන්ගේ සරළ ආවාස ගෙවල් ලෙස පැවති ගල් ලෙන් පසු ව ප්‍රතිමා ගෘහ දක්වා වර්ධනය වීමේ සළකුණු හත්ථිකුච්ඡි ගල් ලෙන් ආශ්‍රිත ව හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


පියරතන හිමි, වැගම (1999) ***සහස්සවත්ථුප්පකරණය.*** චතුර මුද්‍රණාලය. 142, අවිස්සාවේල්ල පාර, වැගම්පිටිය

විජේතුංග, සිරිසමන් (2002) ***රාජාංගන හත්ථිකුච්ඡි විහාරය.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශනයකි. කොළඹ

සෝමානන්ද, නොච්චියේ (1996) ***හත්ථිකුච්ඡි විහාර වංශය.*** සමයවර්ධන. කොළඹ 10